බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2012**

# 11 - ශ්‍රේණිය

# නර්තනය - සිංහල

## පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) - 2 | (11) - 3 | (21) - 3 | (31) - 3 |
| (2) - 3 | (12) - 4 | (22) - 4 | (32) - 2 |
| (3) - 1 | (13) - 2 | (23) - 3 | (33) - 3 |
| (4) - 3 | (14) - 4 | (24) - 1 | (34) - 1 |
| (5) - 4 | (15) - 2 | (25) - 4 | (35) - 4 |
| (6) - 1 | (16) - 2 | (26) - 3 | (36) - 1 |
| (7) - 2 | (17) - 3 | (27) - 2 | (37) - 2 |
| (8) - 1 | (18) - 1 | (28) - 4 | (38) - 3 |
| (9) - 2 | (19) - 1 | (29) - 2 | (39) - 1 |
| (10) - 1 | (20) - 2 | (30) - 4 | (40) - 4 |

## II පත්‍රය

i. කෝට්ටේ
ii. විග්ගුස්සයි (මහපටැඟිල්ල සහ දබරැඟිල්ල දිග හැරි විට දිග ප්‍රමාණය)
iii. මනිපුරි නැටුම් සම්ප්‍රදාය
iv. තම්මැට්ටම
v. වෙම්බු
vi. 17 වෙනි ලූවී
vii. 2 + 3 (සුළු මැදුම් දෙතිත)
viii. කරදිය
ix. 1. ග්‍රහපන්ති කවි 2. කඩතුරා කවි
x. 1. කැලණි පාලම2. සිංහබාහු ...... ආදී වශයෙන්

(ලකුණු 1 × 12 = 12)

i. අදාළ තිත් රූපයන්ට අයත් බෙරපද - උඩරට / පහතරට, දවුල් පද ප්‍රස්තාර කර ඇත්නම්, (ලකුණු 04)
ii. අදාළ තිත් රූපයන්ට අයත් කවි පද ප්‍රස්තාර කර ඇත්නම්, (ලකුණු 04)
iii. අදාළ තිත් රූපයන්ට කස්තිරමක් /ඉරට්ටියක් හෝ කලාසමක් නිවැරදි ව ප්‍රස්තාර කර ඇත්නම් ලකුණු පිරිනමන්න. (ලකුණු 04)

i. රබාන - එකැස් බෙරය යන නමින් ද හඳුන්වනු ලබයි. දේශීය තූර්ය භාණ්ඩ වර්ගීකරණයේ දී රබාන ආතත කොටසට ගැනේ. රබන් වර්ග දෙකකි. එනම් අත් රබාන සහ බංකු රබාන වශයෙනි. අත් රබාන විරිදු ගායනයේ දී සහ නර්තන නිර්මාණවල දී යොදා ගනී. රබන් කරකැවීම ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම විසින් කරනු ලබයි. රබන් කරකවමින් නර්තනයේ යෙදීම ශිල්පීය දක්ෂතා හෙළි දක්වීමකි. රබන් පද වාදනය ගම්බද ප්‍රදේශවල අවුරුදු කාලයේ දී සහ මංගල අවස්ථාවල දී සිදු කෙරෙන අතර බංකු රබාන මේ සඳහා යොදා ගනී. (ලකුණු 04)

ii. සදැස්මත් - ඡන්දස් මාත්‍රා යනුවෙන් ද හඳුන්වනු ලබයි. කාව්‍යකරණයේ දී උපයෝගී වෙයි. කවියක හෝ කවි පාදයක ඇති අක්ෂරවල ලඝු හා ගුරු මාත්‍රා ගණන එකතු කර සදැස්මත් හෙවත් ඡන්දස්මාත්‍රා ගණනය කරනු ලබයි. (ලකුණු 04)

iii. රදළල්ලේ පොඩි මහත්තයා
- සබරගමු නර්තන ශිල්පියෙකි. ගිරාගම සෞන්දර්යය ගුරු විදුහලේ හා සෞන්දර්යය අධ්‍යයන ආයතනයේ කථිකාචාර්යවරයෙකි. පරංගියාවත්තේ පොඩිමහත්තයා ලෙස ද හඳුන්වන මොහු නර්තනයට මෙන්ම ගායනයටත් වාදනයටත් එකසේ දක්ෂය. සබරගමු නර්තනය දේශීය සම්ප්‍රදායක් වශයෙන් ප්‍රමුඛ ස්ථානයකට ගෙනඒමට මුල් වූ තැනැත්තෙකි. (ලකුණු 04)

iv. ගුරුහාමි - ලංකාවේ පැරණිම ජන නාටකය වන "සොකරි" ජන නාටකයේ එන ප්‍රධාන චරිතයකි. ගුරුහ ගුරුහාමි ගේ බිරිඳ සොකරි ය. සමාජයේ වෙසෙන ඇතැම් මිනිසුන්ගේ අඩුලුහුඩු තත්ත්ව පිළිබඳව ගුරුහාමි චරිතයෙන් ඉස්මතු වෙයි. (ලකුණු 0

v. නෘත්‍ය - භාව ප්‍රකාශන (මුහුණේ ඉරියව් වෙනස් කරමින් කෙරෙන ප්‍රකාශන) සහිතව ඉදිරිපත් කෙරෙ නර්තන නෘත්‍ය ලෙස හැඳින්විය හැක. (ලකුණු
සාත්වික අභිනයට හා ආංගික අභිනයට අදාළ කර තිබීම. (ලකුණු 4 × 3 =

4. රූපවාහිනී නර්තන නිර්මාණ පිළිබඳව විමසීමේදී,

i. රූපවාහිනී නර්තන නිර්මාණවල අංගචලන යොදාගැනීම, දේශීයත්වයෙන් බැහැර වීම, බටහිර සහ ඉන්‍ භාරතීය චලන, හස්ත පාද යොදා ගැනීම. (ලකුණු

ii.
- රංග වස්ත්‍රාභරණවල විදේශීය ආභාසය
- අඩ නිරුවත් ඇඳුම් සහ පැළඳුම්
- හුදු විනෝදයට පමණක් ප්‍රමුඛතාවය දෙමින් නර්තන නිර්මාණයන් කිරීම
- අදහස හෝ භාවයන් පිළිබඳව නොතැකීම. (ලකුණු 0

iii. සිසුන් විසින් ඉදිරිපත් කරනු ලබන උචිත යෝජනා අනුව ලකුණු පිරිනමන්න.
- දේශීයත්වය හා අනන්‍යතාවය • සංස්කෘතිය හා සම්ප්‍රදාය • ඒ තුළින් උසස් රසවින්දනය (ලකුණු 0

(ලකුණු 4 × 3 = 12

5. i.
- දක්ෂිණ භාරතයේ වෙරළ තීරයේ (කේරළ ප්‍රදේශයේ) ප්‍රභවය ලැබූ බව
- දේව විශ්වාස පදනම් වූ ගැමි නැටුම් ඇසුරින් බිහිවූ බව
- ග්‍රාම දේව පූජාවල දී මෙම නැටුම් ඉදිරිපත් කළ බව (ලකුණු 04

ii.
- මිනික්කු, පච්චා, කත්ති, තාඩි වශයෙන් ඇති වේශ නිරූපණ ක්‍රමයක් බව
- එම නර්තනයට ම ආවේණික සංකීර්ණ වේශ නිරූපණ ක්‍රමයක් බව
- රංග වස්ත්‍රාභරණවලට උචිත ලෙස සකස්කරගත් වේශ නිරූපණයක් බව (ලකුණු 04

iii. වාද්‍ය භාණ්ඩ - චෙණ්ඩා සහ මෘදංගම් - පංච වාද්‍යම්, එඩැක්ක, ඉලතාලම්, චෙංගලම්, කුම්බි
රංග වස්ත්‍රාභරණ - ඉතා සංකීර්ණයි.
හිස් පළඳනා - වර්ග තුනකි - කිරීටම්, මස්තකි, පර්ශගත
ආදී වශයෙන් ප්‍රශ්නයට අදාළව පිළිතුරු තිබේනම් ලකුණු පිරිනමන්න. (ලකුණු 04)

(ලකුණු 4 × 3 = 12

6. i. සාරධර්ම යනු සමාජයක යහපැවැත්ම උදෙසා පැවත ආ හොඳ පුරුදු ලෙස දක්විය හැක. වැඩිහිටියන් සැලකීම, පිදිය යුත්තන් පිදීම, සාමූහික බව, සමානාත්මතාවය, එකිනෙකාට ගෞරව කිරීම, ඉවසීම, කරුණාව දයාව වැනි දේ සාරධර්මවලට උදාහරණ වේ.
බොහෝ විට ශාන්ති කර්මයක් සිදුකරන්නේ පුද්ගලයකුට හෝ ප්‍රදේශවාසීන්ට හෝ රටවැසියනට සෙත් ශාන්තියක් පතාය. මෙසේ තවත් අයෙකුගේ කරදරයක දී පිහිටවීම හොඳ සාරධර්මයකි. ශාන්ති කර්මයක දී දෙවියන් පුදනු ලබයි. පිදිය යුත්තන් පිදීම හොඳ ගුණාංගයකි. කොහොඹ කංකාරිය වැනි ශාන්ති කර්මයක දී වැඩිහිටි පිළිවෙළ හෙවත් සඟ පිළිවෙළ අනුව නර්තනයේ යෙදෙයි. වැඩිහිටියන්ට ගරු කිරීම මෙහිදී මැනවින් ඔප්පු වෙයි. කප් සිටුවීම, මලපේ කිරීම, තොට පේ කිරීම, අයිලෙ යැදීම, මුරුතැන් පිදීම, යන චාරිත්‍ර තුළ ද ඉහත සාරධර්ම දැකිය හැකිය. (ලකුණු 04)

ii. පන්තිකාමරය තුළ දැකිය හැකි සාරධර්ම 5ක්
1. පාවහන් ගලවා පන්තිකාමරයට ඇතුළුවීම - විෂයට ඇති ගෞරවය
2. නමස්කාරය කිරීම - පිදිය යුත්තන් පිදීම
3. කණ්ඩායම් වශයෙන් ඉගෙන ගැනීම - සාමූහික බව
4. සිසුන් සියලු දෙනාම බිම අසුන් ගැනීම - සමානාත්මතාවය
5. දන්නා අය නොදන්නා අයට කියාදීම - කරුණාව, දයාව (ලකුණු 04)

iii. ඉහත සාරධර්ම ජීවත්වීමට උපකාරී කරගත හැකි ආකාරය විස්තරයට ලකුණු පිරිනමන්න (ලකුණු 04)

(ලකුණු 4 × 3 = 12)

7. i. එක් ශාන්ති කර්මයක් නම් කර එම ශාන්ති කර්මය ප්‍රචලිත ප්‍රදේශ නම් කිරීම (ලකුණු 04)
ii. අරමුණු ලියා තිබීම (ලකුණු 04)
iii. චාරිත්‍ර විධි දෙකක් විස්තර කිරීම (ලකුණු 04)

(ලකුණු 5 × 12 = 60)